රුහුණ විශ්වවිද්‍යාලය

2018/2019 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය

**දෙවන සමාසික පරීක්ෂණය - 2020 මාර්තු - අගෝස්තු**

**SLS 22643 - සිංහල පද්‍ය සාහිත්‍යය (සීතාවක - මාතර)**

**පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**(නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

**කාලය: පැය 03 යි.**

---

**01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.**

(අ) එ ද වි ග සා තරු අසෙසා කුමුදු          රැසා
ගෙන සරසා ය හ න'හ සා සිතු          විලසා
නිසයුරු සා  අ ම ප හ සා විඳින          ලෙසා
සැරසි නි සා තුටුව නිසා' -හන          නොලසා

තැන් තැන දුලන රන් රජතෙ'ව් තොරණ          රඹ
බන් මිණි කිරණයෙන් එකලූ වේ          පුර'ඹ
නන් රන යට'ග ලෙල දද මෙන සුර          සර'ඹ
මන් මෙන එපුර සිරි මේ හැම සකි          නරඹ

(නීලකොබෝ සන්දේශය. සංස්.. පී. බී. එස්. වීරසූරිය)

(ආ) ප බ ඳ කිවින් බැඳි කව් රසෙහි විසිතු          රු
ස බ ඳ විදු දනෝ පළ කෙරෙති දිය තු          රු
නොමඳ රසින් දිවයුරු පොබ යයි තඹු          රු
සු ව ඳ දිගත විහිදයි හමන මඳ ම          රු

විපු ල ගුණැති මහතුන් හට පත් විප          ත
නිස ල නැණින් යුතු උතුමෝ ම දුරල          ත
ක ල ල ගිලුණු මත වරනිඳු ගොඩ ගනු          ත
තුමුල බලැති ගිජිඳෙකු මිස අන් කෙ          වත

(සුභාෂිතය. සංස්.. වේරගොඩ අමරමොලි හිමි)

(ඇ) පුලුපු හෙළ-සුනිල් පත් යුත් කෙහෙල්ගැප් ඇඹුල්මල්
රතඹරකුසුමින් සැදු අඟුල්-පාරුවෙන් නෙක්
දිලිඳු දනඹුවන් හා දූ-සුතන් එක් වෙලා ගොස්
එහි පසෙක රැඳූ දගේ බලා වී පහන් සිත්

දෙව්නැව් නැඟී සුරගගේ මුරුසෙන් ලෙසින් පත්
කව්-ගී-රැඟුම් වෙණ වැයුම් සමඟින් දනන් පත්
ඒ නිල්වලාගඟ දියේ ඔරු-පාරු-හම්බන්
පත් නූ තැනක් කෙළවරක් මෙතෙකැය් ගණන් නැත්

(ගංගාරෝහණ වර්ණනාව. සංස්.. සිරි තිලකසිරි)

(ඈ) දවල මුතු වැල සෙ දද කේසරි පිරි
දෙතොල දළ පෙළැති නිති අමපිරි සැරි
කොමල දිවි කෙමිනුදුල රුබරි තිරි
ලකළ එළඳ මුව රත සර සිරි දුරී

හිමකර ගිමව් යුගතෙහි රිවිරුසේ ලෙසේ
අමකර කුරවි නද යක් හඬ ලෙසේ ඇසේ
යොමකර විදි මදන හද සැර පසේ පසේ
මම කරදර විඳිමි නිති මියුලැසේ මෙසේ

(වියොවගරත්නමාලය. සංස්.. මනෝජ් ප්‍රසාන් රත්නායක)

(ලකුණු 20)

02. මහනුවර-මාතර සාහිත්‍ය අවධියෙන් නව කාව්‍ය සම්ප්‍රදායක ආරම්භය සනිටුහන් වන ආකාරය සසාධක ව පරීක්ෂා කරන්න.

03. "ගංගාරෝහණ වර්ණනාව නිර්මාණාත්මක පක්ෂයෙන් අසාර්ථක කාව්‍යයකි." මේ අදහස පිළිබඳ ඔබේ විනිශ්චය තර්කානුකූල ව පහදන්න.

04. වියොවගරත්නමාලයේ ශෘංගාර රසය උද්දීපනයට කවියා භාවිත කාව්‍යෝපක්‍රම සනිදර්ශන ව විමසන්න.

05. සම්භාව්‍ය සිංහල මහා කාව්‍ය හා සසඳන කල මාතර අවධියේ රචිත කව්මුතුහර සාර්ථක මහා කාව්‍යයක් ලෙස අගය කළ හැකි දැයි පරීක්ෂා කරන්න.

06. ශබ්දාර්ථ සුසංයෝගයෙන් කාව්‍ය නිර්මාණයට, නීලකොබෝ සන්දේශ කවියා දැක්වූ නෛපුණ්‍ය සනිදර්ශන ව පැහැදිලි කරන්න.

07. සීතාවක යුගයෙහි පද්‍ය සාහිත්‍යකරණයෙහි ලා අලගියවන්න මුකවෙටි කවියාගේ දායකත්වය කෙබඳු දැයි පැහැදිලි කරන්න.

08. උපමාලංකාර භාවිතයෙන් උපදෙස් සැපයීමට සුභාෂිත කවියා ගත් උත්සාහය නිදසුන් දක්වමින් විමසන්න.

නැතහොත්

ලෝකෝපකාර කවියා උපදේශ කාව්‍ය නිර්මාණයේ දී වෙනත් භාෂා සාහිත්‍ය කෘතිවලින් ලත් ආභාසය නිදර්ශන සහිත ව විග්‍රහ කරන්න.

(ප්‍රශ්න 02 - 08 දක්වා පිළිතුරුවලට ලකුණු 10 බැගිනි.)

@@@@@@@@@@@@